// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2052/34 - 2018 ජනවාරි මස 05 වැනි සිකුරාදා - 2018.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වන අධිකාරය)

3 ඇ වගන්තිය යටතේ නියමය

(2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 3 ඇ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාෆා වන මම, 2017 පෙබරවාරි මස 17 වැනි දිනැති අංක 2006/44 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමයෙහි ඇතුළත් අංක 02 - ගම්පහ දිස්ත්‍රික්කයේ, අංක 16 - මහර ප්‍රාදේශීය සභාවේ අංක 31 දරන කොට්ඨාසයේ නම ලෙස දක්වා ඇති ''අක්බාර්ටවුන්'' යන කොට්ඨාස නාමය වෙනුවට එඬේරමුල්ල 01 යන නාමය ඇතුළත් කරමින් එම නියමය මෙයින් තවදුරටත් සංශෝධනය කරමි.

ෆයිසර් මුස්තාෆා,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2018 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

කොට්ඨාසයේ අංකය :- 31
කොට්ඨාසයේ නම :- එඬේරමුල්ල 01

කොට්ඨාසය සඳහා තෝරාපත් කළ යුතු
සභික සංඛ්‍යාව :- 02

| මායිම් | | සංයුක්ත කොටස් |
|---|---|---|
| *උතුරට* | : ගොංගිතොට ග්‍රාම නිලධාරී වසමේ දකුණු හා නැගෙනහිර මායිම් සහ වත්තල ප්‍රාදේශීය සභා මායිම | 255 A - අක්බාර්ටවුන් ග්‍රාම නිලධාරී වසම |
| *නැගෙනහිරට* | : දළුපිටිය බටහිර ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම, පින්නමැද ග්‍රාම නිලධාරී වසමේ උතුරු හා බටහිර මායිම්, එඬේරමුල්ල බටහිර ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම සහ නාතුඩුව බටහිර ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම | 255 B - එඬේරමුල්ල දකුණ ග්‍රාම නිලධාරී වසම |
| *දකුණට* | : කැලණිය ප්‍රාදේශීය සභා මායිම | 255 D - පින්නමැද බටහිර ග්‍රාම නිලධාරී වසම |
| *බටහිරට* | : කැලණිය ප්‍රාදේශීය සභා මායිම සහ අප්පුගෙවත්ත හා ගොංගිතොට බටහිර ග්‍රාම නිලධාරී වසම්වල නැගෙනහිර මායිම් | 255 E - එඬේරමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම |